IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - I කොටස

## 2016/2017 - ප්‍රථම සෙමෙස්තරය

(පවත්වන ලද්දේ 2018 දෙසැම්බර්)

## BLE 103 – ලේඛකත්වය හා සන්නිවේදනය

අයදුම්කරුවන්ට උපදෙස් :

(1) ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් (02) සහ පිටු දෙකකින් (02) සමන්විත වන අතර ප්‍රශ්න සංඛ්‍යාව දහයකි (10) කි.

(2) එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න 02 ක් වත් තෝරා ගෙන ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

## 1 කොටස

1. 'සන්නිවේදනය' යන සංකල්පය හඳුන්වා එහි මූලික ප්‍රභේද පැහැදිලි කරන්න.

2. "භාෂාව වූකලි ප්‍රධානතම සන්නිවේදන මාධ්‍යය යි." මානව භාෂාව පිළිබඳ වාග් විද්‍යාත්මක නිර්වචනයක් ඇසුරින් විමසන්න.

3. <u>එක්කෝ</u>

   'භාෂා ද්විරූපතාව' යනු කුමක්ද? සිංහල භාෂාව හා සන්නිවේදනය කෙරේ එය බලපා ඇත්තේ කෙසේ ද?

   <u>නැතහොත්</u>

   සන්නිවේදන කටයුතුවල වර්ධනයත් සමග සිංහල ලේඛන ක්‍රමයේ ඇති වූ වෙනස්කම් කවරේදැයි පැහැදිලි කරන්න.

4. 'පුවත්පත් බස් වහරේ ප්‍රභේද ගණනාවක් දැකිය හැකි ය." සිංහල පුවත්පත් කලාව ඇසුරින් විමසන්න.

5. පහත සඳහන් මාතෘකාවලින් <u>තුනක්</u> පිළිබඳව සටහන් ලියන්න.

   I සන්නිවේදන ක්‍රියාවලිය
   II මානව සන්නිවේදනයේ මුද්‍රණ යුගය
   III යටිකුරු පිරමිඩ ආකෘතිය
   IVගුවන් විදුලි බස

## II කොටස

6. "සිංහල හෝඩියේ අක්ෂර සංඛ්‍යාව 60 දක්වා වැඩි වී ඇත". පැහැදිලි කරන්න.

7. 'අක්ෂර වින්‍යාසය' යනු කුමක්දැයි පැහැදිලි කොට සිංහල අක්ෂර වින්‍යාසයේ දක්නට ලැබෙන පොදු වැරදි 10ක් පිළිබඳ විවරණයක් සපයන්න.

8. නිර්මාණාත්මක ලේඛනය හා ශාස්ත්‍රීය ලේඛනය අතර ඇති වෙනස්කම් කවරේදැයි පැහැදිලි කරන්න.

9. " නූතන සිංහල ලේඛන ව්‍යවහාරයේ රීති විවිධත්වයක් දැකිය හැකි ය." නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

10. පහත සඳහන් මාතෘකාවලින් <u>තුනක්</u> පිළිබඳව සටහන් ලියන්න

I අමිශ්‍ර සිංහල හෝඩිය

II න ණ ල ළ භේදය

III ලේඛන ක්‍රියාවලිය

IV කර්තෘ වර්ග ක්‍රමය හා පිටු අග සටහන් ක්‍රමය